www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජර්මානු ආන්ඩුවේ අර්බුදය දුවවන්නේ කුමකින්ද ?

## What is driving the crisis of the German government?

2010 ජූනි 18

ජර්මානු සන්ධාන ආන්ඩුවේ අර්බුදය සති ගනනාවක් පුරා ඇදී යමින් තිබේ. සන්ධාන පක්ෂ තුන වන ක්‍රිස්තියානි ප්‍රජාතාන්ත්‍රවාදී සංගමය (සීඩීයූ), එහි සහෝදර පක්ෂය වන ක්‍රිස්තියානි සමාජ සංගමය (සීඑස්යූ) සහ නිදහස් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (එෆ්ඩීපී) එකඟ වන කිසිදු ප්‍රශ්නයක් නැති තරම්ය. කප්පාදු පිලිවෙත් ක්‍රියාත්මක කරන්නේ, බදු ප්‍රතිපත්තිය, සුව ආරක්ෂනය හෝ මිලිටරි සේවාව මතද යන්න ගැන ආන්ඩු පක්ෂ හෝ එම පක්ෂවල විවිධාකාර අංශ එකිනෙකා සමඟ පොර වැදී සිටිති.

චාන්සලර් ඇන්ජෙලා මර්කෙල්ගේ ආන්ඩුවේ (සීඩීයූ) ඡන්ද පදනම් කඩා වැටී ඇත. එන ඉරිදා මහ මැතිවරනයක් පැවත්වුවහොත් එෆ්ඩීපීය යන්තම් සියයට පහක ඡන්ද ප්‍රතිශතයක් ලබනු ඇත. මෙය මීන් මාස නවයකට පෙර එෆ්ඩීපීය ලැබූ සියයට 15ක ඡන්ද ප්‍රතිඵලයෙන් පසු ඇතිවූ තියුනුම කඩා වැටීමකි.

සීඩීයූ, සීඑස්යූ යාන්තමින් සියයයට 30 ඉක්මවා ඡන්ද හිමිකරගන්නා අතර, විපක්ෂයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය ( එස්පීඩී ) මෙම අගයට පහලින් සිටියි. අනෙක් අතට, මධ්‍යම පන්තියේ දේශපාලන ව්‍යාකූලත්වය පිලිබඳ නොවරදින සලකුනක් බවට පත් වෙමින් හරිතයන් වාර්තාගත සියයට 18ක ඡන්ද ප්‍රතිශතයකට හිමිකම් කියති.

එස්පීඩී සහ හරිතයන් ඒකාබද්ධව වර්තමාන සන්ධාන ආන්ඩුවට වඩා ඉහල ඡන්ද ප්‍රතිශතයක් වාර්තා කොට තිබුන ද ඔවුන්ට බහුතරයකින් යුත් ආන්ඩුවක් තැනිය හැක්කේ සිය ඡන්ද ප්‍රතිශතය සියයට 11 නොවෙනස්ව පවත්වා ගෙන සිටින වාම පක්ෂයේ සහාය ලබා ගැනීමෙන් පමනකි.

එෆ්ඩීපීයේ ගයිඩෝ වෙස්ටර්වෙල් හා මර්කෙල්ගේ නායකයත්වයෙන් යුත් ආන්ඩුවේ අවසානය පිලිබඳව පසුගිය සතියේ ප්‍රධාන පුවත්පත් විසින් අනාවැකි පල කෙරින. ඇතැම් මාධ්‍ය එවැනි අවසානයක් ඉල්ලා සිටියේය.

එලැඹෙන සති අන්තයේ සුව ආරක්ෂන ප්‍රතිසංස්කරන පිලිබඳව ඇතිවීමට නියමිත සාකච්ඡාවලදී ආන්ඩුවේ අභ්‍යන්තර අර්බුදය ඉස්මත්තට පැමිනිය හැක. එෆ්ඩීපීය බදු වැඩපිලිවෙලක් වෙනුවෙන් තරයේම යෝජනා ඉදිරිපත්කරන අතර සීඑස්යූව එය එකහෙලාම ප්‍රතික්ෂේප කරයි.

අනෙක් අතට, ජූනි 30වෙනි දිනට නියමිත පාර්ලිමේන්තු මැතිවරනයේදී ජර්මන් ජනාධිපති ධුරය සඳහා සීඩීයූ සහ එෆ්ඩීපී ඒකාබද්ධ අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වන ක්‍රිස්ටියන් වුල්ෆ් පරාජය වුවහොත් ආන්ඩුව බිඳවැටිය හැක. ප්‍රතිවාදී අපේක්ෂකයා ලෙස එස්පීඩී සහ හරිතයන් විසින් තෝරාගෙන ඇති ජෝකිම් ගෝක් සඳහා සැලකිය යුතු සහයක් එෆ්ඩීඒය තුල පවතී.

ජර්මන් ආන්ඩුවේ අර්බුදය, එහි ප්‍රමුඛ නායකයින්ගේ දුර්වලතාවෙන් - මර්කල්ගේ පාර්ශවයෙන් තීරනාත්මක භාවයේ ඌනතාව, වෙස්ටර්වෙල්ගේ හැසිරීමේ අපරිනතභාවය හා සීඑස්යූ නායක හෝර්ස්ට් සීහොෆර්ගේ අනිශ්චිත බව යන ඒවායින්- පැන නගින්නක් බව බොහෝ විචාරකයෝ නිශ්චය කරති. එහෙත් හේතු ඊට වඩා බොහෝ ගැඹුරට දිව යයි. ආන්ඩුවට පිලිතුරු දිය නොහැකි අතිමූලික සමාජ පරිවර්තනයන්ට එය මුහුන දී සිටී.

ජර්මනියට පශ්චාත් යුද කාලීන දශකයන් තුල එක්තරා ස්ථාවරභාවයක් සම්පාදනය කරදුන් සමාජ සමතුලිතයේ පිලිවෙතට, දශක ගනනාවක් තිස්සේ සුභ සාධන කැපීම හා ජාත්‍යන්තර ආර්ථික අර්බුදයේ පලවිපාකයන් හේතුකරගෙන දැන් වලකැපී ඇත. විශේෂයෙන්ම, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ සාම්ප්‍රදායික පලිහ බවට පත්ව සිටි මධ්‍යම පන්තීන් බිඳ වැටෙමින් ද අඩපන වෙමින් ද පවතී.

මධ්‍යම පන්තීන්ගේ ඛාදනය පිලිබඳව ජර්මානු ආර්ථික පර්යේෂනය සඳහා වන ආයතනය විසින් කරන ලද අධ්‍යයනයකට ඉමහත් අවධානයක් ලැබී තිබීම අහම්බයක් නොවේ. දිලිඳු ජනයාගේ සංඛ්‍යාවේ වර්ධනයත්, ඊට වඩා අඩු මට්ටමකින් ධනවතුන් සුලු කොටසක් මධ්‍යම මට්ටමේ ආදායම් ලබන කොටසේ

වියදම මින් තරවී ඇති බවත් පර්යේෂකයෝ පෙන්වා දුන්හ. ප්‍රබල මධ්‍යම පන්තියක් "සමාජ ස්ථාවරත්වය පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය වන්නේ යයි" ඔවුහු අනතුරු ඇඟවූහ.

ධනවතුන්ගේ ආත්මාර්ථකාමීත්වයට කන්නලව් කරන මූල්‍ය ප්‍රභූව වෙනුවෙන් ප්‍රසිද්ධියේ පෙනී සිටින වෙස්ටර්වෙල්ගේ එෆ්ඩීපීය, සමාජ පසුබෑම පිලිබඳව මධ්‍යම පන්තියේ භීතිකාව ගසා කමින් එය සමාජයේ දුප්පත්ම කොටසට එරෙහිව මෙහෙයවිය හැකි බව ඒත්තු ගෙන සිටියි. එහෙත්, "පැරනි රෝමානු දිරාපත් වීමේ" උදාහරන ලෙස ඔහු හෙලාදකින සුභසාධක ලාභීන් වෙත ඔහු එල්ල කරන ප්‍රහාර මුලුමනින්ම පොට වරද්දාගෙන තිබේ.

"ජර්මනියේ මූල්‍යමය රාමුව තර්ජනයට ලක් කරන නින්දා සහගත චර්යාව පැමිනෙන්නේ සමාජ පද්ධතියේ පතුලෙන්ය යන හැඟීම වර්තමානයේදී ජර්මනියේ [සමාජ] කේන්ද්‍රයට නොදැනේ" යයි ගොතින්ගෙන්හි තත්කාර්යවාදී දේශපාලන විද්‍යාඥයින්ගේ අධ්‍යනයක් නිගමනය කලේය. අනෙක් අතට එය ''ඉහල විධායක නිලධාරීන්, බැංකුකරුවන් හා මූල්‍ය සමපේක්ෂකයන් කරා'' පැමිනෙන විට " කේන්ද්‍රයේ බහුතරය එස්පීඩීයට වඩා රැඩිකල් ලෙස කතා කරයි."

එෆ්ඩීපීයේ සීග්‍ර පරිහානිය මෙයින් පැහදිලි කෙරෙයි.

සීඩීයූ / සීඑස්යූ, වෙනස් සමාජයීය පදනම් සහිත ප්‍රාදේශීය කන්ඩායම් හා පක්ෂ අතරේ සිරවී ඇත. සමාජය එහෙම පිටින්ම කඩා වැටෙමින් පවතින විට මහ ධනවතුන්ගේ නියෝජිතයන්, කුඩා ව්‍යාපාර හිමිකරුවන්, ගොවියන්, සිවිල් සේවකයින් සහ කම්කරුවන් තනි පක්ෂයක ධජය යටතේ එක්සත් කල නොහැක. ගැඹුරු අර්බුදයකට නතුව සිටින ක්‍රිස්තියානිය, එක්සත් පක්ෂ හවුලක් වසයෙන් එහි ශක්‍යතාව බොහෝ කලකට ඉහතදී ම නැති කර ගත්තේය.

විදේශ සබඳතාවන් තුලදී ද ෆෙඩරල් ආන්ඩුව නව අභියෝගයන්ට මුහුන දෙයි. ඇඩෝනෝර්ගේ කාලයේ පටන් ජර්මන් විදෙස් පිලිවෙතේ නියාමක මූලධර්මයක් වූ අපරදිග සන්ධානය කැබලිති වෙමින් තිබේ. ඉරාක හා ඇෆ්ගනිස්ථාන් යුද්ධ සහ උත්සන්න වෙමින් පවතින අන්තර් අත්ලාන්තික් ආතතීන්ගේ සන්දර්භය තුල, එක්සත් ජනපදය සමග දිගුකාලීන සමීප සබඳතාව වාසනාවට හෙනහුරෙක් වසයෙන් මතුවෙමින් තිබේ. යුරෝපය තුල ඝට්ටන උග්‍රවෙමින් තිබෙන අතර යුරෝපීය සංගමය බිඳහෙලීමට තර්ජනය කරයි.

මෙම කොන්දේසි යටතේ, එස්පීඩීය යලි බලයට ගෙන ඒම සඳහා වඩ වඩාත් ඉල්ලීම් ඉදිරිපත් වෙමින් තිබේ. කම්කරුවන්ගේ සහ සොල්දාදුවන්ගේ ප්‍රහාරයෙන් ධනේශ්වර දේපල සබඳතා බේරා ගත් 1918 නොවැම්බර් විප්ලවයේ සිට එස්පීඩීය, පවත්නා පාලන තන්ත්‍රයන් රැකගැනීමටත්, අර්බුද කාලයන්හි දී අවශ්‍ය වෙනස්කම් ක්‍රියාත්මක කිරීමටත් යලි යලිත් කැඳවනු ලැබ තිබේ.

1969 යේදී එස්පීඩී චාන්සලර් විලී බ්‍රාන්ට්, කැරලිකාරී තරුනයින් වීදිවලින් පලවා හැරි අතර ජර්මානු අපනයන සඳහා නව වෙලඳපොලවල් සොයාගැනීමට ඔහුගේ බෙහෙවින් මතභේදයට පත් ඔස්ට්පොලිටික් වැඩපිලිවෙල තුලින් සහය ලබා දුන්නේය. 1998 දී හෙල්මුට් කෝල් (සීඩීයූ) යටතේ "එකතැන පල්වීම" පිලිබඳව මහ ව්‍යාපාරිකයන් නැගූ චෝදනා හමුවේ ගේර්හාඩ් ෂ්රූඩර් (එස්පීඩී), ඔහුගේ 2010 සමාජ "ප්‍රතිසංස්කරන" න්‍යාය පත්‍රය ඉදිරියට දමමින් සමාජ ආරක්ෂන පද්ධතියට වල කැපීය.

රාජ්‍යයේ බලපෑම ආපසු හැරවීමේ අවශ්‍යතාවෙන් පෙලෙන එෆ්ඩීපීයට වෙනස් ලෙස එස්පීඩීය සැලකිලිමත් වන්නේ, අර්බුද කාලයන්හි දී අත්‍යවශ්‍ය වනු ඇති ශක්තිමත් රාජ්‍යයක්, එනම් එස්පීඩී-හරිත පක්ෂ සන්ධානයක සත් වසරක කාලය තුලදී සහ මහා සන්ධානයේ සිව් වසරක කාලය තුලදී බෙහෙවින් කාබාසිනියා කර දමා ඇති ප්‍රබල සුභ සාධක රාජ්‍යයක් නොව, වෘත්තීය සමිති ඔස්සේ කම්කරුවන් විනයගත කරමින් හා සුභසාධක ලාභීන් පොදුවැඩවල නිරත කරවීමට බලකරන, දැඩි හස්තයකින් යුතුව ක්‍රියාත්මක වන හා සමාජ පන්තිවලට ඉහලින් සිටගන්නා රාජ්‍යයක් පිලිබඳව ය.

වෘත්තීය සමිති තමන්ගේ පැත්තෙන් එවැනි භූමිකාවක් පවරා ගැනීමට ඕනෑවටත් වඩා කැමැත්ත දක්වති. එස්පීඩීයේ අංක එකේ ප්‍රමුඛතාව යොමුව පවතින්නේ "සමාජ සන්හිඳියාව" පවත්වා ගැනීම, එනම්, එහි අර්ථය පසුගිය දශක හයේ සමාජ ජයග්‍රහන සියල්ලම අතහැර දැමීම වුවත්, පන්ති අරගලය මර්දනය කිරීමයි.

එස්පීඩීයට හරිතයන්ගේ සහය මතද විශ්වාසය තැබිය හැකිය. පාරිසරිකවාදයේ හා සාමයේ එම පැරනි පක්ෂය, රුදුරු මූල්‍ය විනය පවත්වා ගැනීමේ සහ විදේශ මිලිටරි මෙහෙයුම්වල සහයකයෙක් බවට පත්වී බොහෝ කලක් ගතවී තිබේ.

ස්ටැලින්වාදී නැගෙනහිර ජර්මනියේ පාලක පක්ෂයට උරුමකම් කියන වාම පක්ෂය මෙන්ම එය ද සෑම විටම "සමාජවාදය" යන්නෙහි අර්ථය, කම්කරුවන්ගේ මොනයම්ම හෝ ස්වාධීන ව්‍යාපාරයක ගෙල සිරකරලන ශක්තිමත්, අධිකාරිවත් රාජ්‍යයක් යයි

විශ්වාස කරයි. හිටපු එස්පීඩී ප්‍රධානියා වූ හා දැන් වාම පක්ෂයේ ප්‍රධානියා වන ඔස්කාර් ලාෆොන්ටේන් වසර තිහකට ඉහත ඔහු සාර්බෲකන්හි නගරාධිපතිව සිටිය දී සුභසාධක ලාභීන්ට සමාජ වැඩවල නිරත වන ලෙස බලකරමින් ජාතික නායකත්වයක භූමිකාවක් ඉෂ්ඨ කලේය. පසුව, සාර්ලෑන්ඩ් පලාතේ පාලකයා ලෙස, වෘත්තීය සමිති සමඟ සමීප සබඳතාවකින් වැඩ කරමින් කලාපයේ වානේ සහ පතල් කර්මාන්තය බුන්වත්වීමෙන් ගලවා ගත්තේය.

වාම පක්ෂය, සහාග හවුල්කරුවෙක් ලෙස හෝ එස්පීඩී-හරිත සුලුතරයේ ආන්ඩුවකට සහාය පලකරමින් හෝ එය මේ මොහොතේදී උතුරු රයින්-වෙස්ට්පාලියාහි සූදානම් කරමින් තිබෙන ආකාරයට එස්පීඩීයට බලය ලබා ගැනීම සඳහා සහය දීමට අදිටන් කරගෙන සිටී.

සීඩීයූ/ සීඑස්යූ-එෆ්ඩීපී සන්ධානය සැබවින්ම එහි නිල කාලයට පෙර බිඳවැටෙන්නේ ද යන්න විවෘත ප්‍රශ්නයකි. පාර්ලිමේන්තු වාරයක් අතරතුර ආන්ඩු වෙනසක් සඳහා ව්‍යවස්ථාව ඉඩ සලසන්නේ සුවිශේෂ අවස්ථාවන් යටතේ පමනක් වන අතර, නව මැතිවරනයක් සඳහා සීඩීයූ/සීඑස්යූ හා එෆ්ඩීපී තුල ඇත්තේ හීන උනන්දුවකි.

පවත්නා ආන්ඩුව විස්තාපනය කරන්නේ කවර ආකාරයේ සන්ධානයකින් ද යන ප්‍රශ්නය ද විවෘත එකකි. එනම්, නව මැතිවරනවලින් තොරව පවා බහුතරයක් මෙහෙයවනු ඇති සීඩීයූ හා එස්පීඩී මහා සන්ධානයක්, එස්පීඩී, එෆ්ඩීපී හා හරිතයින්ගේ හවුලක්, නොඑසේ නම් වාම පක්ෂයේ සහභාගිත්වයෙන් හෝ සහයෙන් ඇති කරන එස්පීඩී-හරිත සන්ධානයක්? අවසානයට සඳහන් කල සන්ධාන දෙවර්ගය ඇතිවිය හැක්කේ නව මැතිවරනයක් ඔස්සේය.

එක් දෙයක් නිශ්චිතයඃ ආන්ඩු කිරීමට එස්පීඩීය නැවත පැමිනීමක් වාමාංශික වර්ධනයක් නියෝජනය නොකරනු ඇත යන්නයි. එවැන්නක් ශුභසාධන කප්පාදුව පෙරට ගෙන යමින්, ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට එරෙහිව නව වටයකින් ප්‍රහාර එල්ල කරනු ඇත. එමෙන්ම එය මෑතකදී එක්සත් රාජධානියේ, නෙදර්ලන්තය, බෙල්ජියම හා හන්ගේරියාවේ සිදුවූවාක් මෙන් මධ්‍යම පන්තියේ දේශපාලනික මංමුලා සහගතභාවය දක්ෂිනාංශික ප්‍රකාශනයක් අත්කර ගැනීමේ අනතුර වැඩි කරනු ඇත.

අනාගත වර්ධනය රඳා පවතින්නේ කම්කරු පන්තියේ ස්වාධීන ක්‍රියාකාරිත්වය මතය. එයට එස්පීඩීය, වෘත්තීය සමිති හෝ වාම පක්ෂයේ මිත්‍යාවන් මඟින් විලංගු ලා ගැනීමට ඉඩදිය නොහැක.

එය, ධනපති පන්තියේ සියලුම කන්ඩායම් සහ 'වාම' මෙන්ම දක්ෂිනාංශික සියලුම පක්ෂවලින් එහි දේශපාලන ස්වාධීනත්වය අත් කරගත යුතුය. රැකියා, ආදායම්, ප්‍රජාතාන්ත්‍රීය හා සමාජ අයිතීන් ආරක්ෂා කරගත හැකිවන්නේ බැංකු හා මහා සංගත සමාජ අයිතියට පරිවර්තනය කරන සහ ප්‍රජාතාන්ත්‍රීය පාලනයට නතු කරන සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත පමනි.

නව දේශපාලන පක්ෂයක්, හතරවන ජාත්‍යන්තරයේ ජර්මන් ශාඛාව ලෙස පාටි ෆර් සොසියාලේ ග්ලීචිට් (සමාජවාදී සමානතා පක්ෂය) ගොඩනැගීම එමඟින් ඉල්ලා සිටී.

පීටර් ෂ්වාර්ස්

© www.wsws.org